ස්වදේශ කටයුතු චක්‍රලේඛ: 18/2019

මගේ අංක :ඒ.එෆ් /1/02/ පොසොන්
අභ්‍යන්තර, ස්වදේශ කටයුතු සහ පළාත් සභා
සහ පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ-07
2019.06.07

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියළුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්.
සියළුම සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්,
ප්‍රාදේශිය ලේකම්වරුන්,

## රාජ්‍ය පොසොන් උත්සවය සැමරීම -2019

ශ්‍රී බුද්ධ වර්ෂ 2563 ක් වූ 2019 ජූනි මස 16 වන ඉරුදින පොසොන් පෝය දිනය වශයෙන් ප්‍රකාශයට පත්කර ඇති අතර, මෙවර පොසොන් උත්සවය වෙනුවෙන් 2019 ජූනි මස 12 වන දින සිට 18 වන දින දක්වා කාල සීමාව පොසොන් සතිය ලෙස රජය මගින් ප්‍රකාශයට පත්කර ඇත.

(02). එසේම, "සබ්බේ තසන්ති දන්ඩස්ස" (සියළු සත්වයෝ දඬුවමට බිය වෙති) යන තේමා පාඨය පොසොන් තේමා පාඨය ලෙස රජය විසින් තෝරාගෙන ඇත.

(03). එබැවින්, 2019.06 13 වන දින රාත්‍රී සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සර්ව රාත්‍රික පිරිත් පිංකම් සංවිධානය කිරීමටත් 14 වන දින සාංඝික දහවල් දානය අවම වශයෙන් භික්ෂූන් වහන්සේලා 12 නමක් සඳහා පිරිනැමීමටත් කටයුතු සංවිධානය කල යුතුය. මෙම කාර්යය සම්බන්ධයෙන් අවශ්‍ය වන ප්‍රතිපාදන අභ්‍යන්තර, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් සපයනු ලැබේ.

(04). එසේම, 2019 ජූනි 12 වන දින සිට 18 වන දින දක්වා රජයේ සියළු ආයතනවල හා ගොඩනැගිලිවල බෞද්ධ කොඩිය ඔසවා තැබීමටත්, එම සියළු ආයතන සහ ගොඩනැගිලි පොසොන් සැරසිලි වලින් අලංකාර කිරීමටත් තීරණය කර තිබේ.

(05). තවද, දිවයින පුරා සුරාසැල් හා මස්කඩ වසා දැමීමට තීරණය කර ඇත.

(06). මෙයට සමගාමීව, ඔබ කොට්ඨාශයේ සියළුම ග්‍රාම නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කර ඔවුන්ගේ සේවය ග්‍රාමීය මට්ටමින් මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ලබා ගැනීමටත් අවශ්‍ය උපදෙස් ලබා දීම.

(07). සියළුම අන්‍යාගමිකයන්ගේ සහයෝගය ලැබෙන පරිදි සහ ආගමික සංහිඳියාව වර්ධනය වන ආකාරයට සියළුම ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් රාජ්‍ය පොසොන් උත්සව පවත්වන ලෙසට උපදෙස් ලබා දීම.

(08) . ඒ අනුව ඉහත ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව කටයුතු සිදු කරන ලෙසත්, ඒ සම්බන්ධයෙන් ඔබ යටතේ ඇති සියළුම ආයතන සහ නිළධාරීන් දැනුවත් කර ඔවුන්ගේ දායකත්වය ලැබෙන පරිදි කටයුතු සංවිධානය කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

එම්.එම් ගාමිණී සෙනෙවිරත්න
ලේකම්
අභ්‍යන්තර, ස්වදේශ කටයුතු සහ පළාත්
සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත්.

01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්